# ‘අපට ලොක්කන් නැතුවම බැරි ද?

## පශ්චාත් අරගල දේශපාලන සන්දර්භය පිළිබඳ මහජන අදහස්’ රැගත්

**නීතිය හා සමාජ භාරය විසින් ප්‍රකාශයට පත්කරනු ලැබූ ප්‍රකාශනය එළිදැක්වීමට සමගාමී ව 2023 මාර්තු 31 දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී පැවැත්වුනු සාකච්ඡාවේ දී දිලීප විතාරණ විසින් සිදුකළ අදහස් දැක්වීම**



මේක ලොකු ජනතා නැගිටීමක්. මේක වටා එක් වුණා විවිධාකාර අය. විවිධ පන්නයේ අය. විවිධ පාන්තික කොටස්. විවිධ ජාතික කොටස්. සමහරවිට පරස්පර විරෝධි වුවමනාවන් තිබුණ කොටස්. මොකද focus එකට එකඟ වෙන්න පුළුවන් වුණා. ඒක තේමාවක්. එතකොට ඒකේ තියෙන පුළුල් ස්වභාවය නිසා ඒක homogenize, සමජාතික කණ්ඩායමක් නෙමේ විවිධ ජාතියේ කණ්ඩායම්. විවිධ දේවල්වලට ආවා. පරස්පර අදහස් තිබ්බා. හැබැයි කට්ටිය එකඟ වුණා වැඩේ කරන්න. දෙවැන්න තමයි ඒ නිසා ම අරගලයට අයිතිකාරයෙකුත් නැහැ. අරගලයට අයිතිය කියන්න පුළුවන් කෙනෙකුත් නැහැ. ඒක ඊට ලොකුයි. මේක ගෙනියන්න ඕනි... ඒ තරම් විශාල ජනතා නැගිටීමක් ලොකු කාලයක් අඳින්න බැහැ.... අපිට ඊළඟ face එකට මාරු වෙන්න වෙනවා, ඊළඟ face එක හැබැයි යම් සංවිධානත්මක ස්වරූපයේ face එකක් වෙන්න ඕනි.

මේ අරගලය පැන නැඟුනේ මම දකින විදියට සාධක ගණනාවක් එකමත පතිත වෙලා. ඒ අතිපිහිතවීම සිදුවූ මෙහොතේදී තමයි අරගලය පත්තු වෙන්නේ. ඒ සාධක එකක් හෝ මිස් වුණා නම් අරගලය එන්නේ නැහැ කියන එකයි මගේ අදහස. සාධක 4 ක් මම හඳුනා ගන්නවා. ඒ හතරෙන් එකක් හෝ මග හැරුණා නම් ඒ විදියට ඒ අරගලය පැන නඟින්නේ නැහැ. ඒ සාධක 4 තමයි, අපි කවුරුත් දන්නා ඩොලර් අර්බුදය. ඒකත් එක්ක රටේ දැවැන්ත අර්බුදයක් පැන නැගුණා. රටේ තෙල් නැති වුණා, ගෑස් නැති වුණා, භාණ්ඩ හිඟ වුණා, මිනිසුන්ට පෝළිම්වල ඉන්න වුණා, ලයිට් නැති වුණා. ඒකත් එක්ක පන්ති භේදයකින් තොරව ඒ කියන්නේ ඉහළ මධ්‍යම පන්තියේ ඉඳලා අන්තිම පල්ලෙහා ස්ථර දක්වා මුළු සමාජයම එක්රැස් වුණා, එක්තරා විදිහක විරෝධයක් පැන නැගුණා මේ සමාජය ඇතුලේ. ඒක දැවැන්ත විරෝධයක්. ජීවත් වීමට ඇති අපහසුව නිසාම පන්ති බේදයකින් තොරව ඇති වෙච්ච ලොකු කෝපයක් සහ නැඟී සිටීමක් ඇති වුණා. ඒක අරගලය ඇති වෙන්න පසුබිම් වුණ ප්‍රධානම සාධකයක්.

දෙවැන්න තමයි ඒ වන විට සමාජය පුරා පැතිරිලා තිබුණ දූෂණය ගැන හොරකම ගැන, මුන් කොල්ලකෑවා කියන ලොකු කතිකාව. ඒක කාලයක් තිස්සේ පැවත ගෙන ආව කතිකාවක්. ඒ කතිකාව නිසා තමයි පුළුවන් වුනේ මිනිසුන්ගේ විරෝධය හරියට කේන්ද්‍රගත (focus) කරන්න. ලොකු ප්‍රශ්නයක් තිබුණා, ජීවත් වෙන්න අමාරුයි, සෑහෙන්න අර්බුදයක ඉන්නේ කියල. එතකොට මේකට focus එකක් ආවා අර කතිකාව තුලින්. කේන්ද්‍රය තමයි ප්‍රභූ තන්ත්‍රය, විශේෂයෙන්ම රාජපක්ෂවරු. ඒක ටිකක් ලොකුවට පැතිරුණා, රනිල්ලාත් සම්බන්ධ හොරකම පිළිබඳ ව කාලයක් තිස්සේ පැවති කතිකාව. ඒ මොහොතේ ඉස්මතු වුනේ විශේෂයෙන් රාජපක්ෂ පවුල සහ පොහොට්ටුව. එතකොට මුන් මේ රටට කෙළියා, මුන් තමයි මේකට වගකියන්න ඕනි කියන චෝදනාව එල්ල වුණා. ඒ කියන්නේ මිනිසුන්ට අමාරු වුනේ නැහැ අර්බුදය හමුවේ කවුරු එක්ක ද අපි සටන් කරන්න ඕනි කියලා තේරුම් ගන්න. මං හිතනවා විශේෂයෙන් ඔය ජනතා විමුක්ති පෙරමුණ සහ NPP අය විසින් මැදිහත් වෙලා දූෂණය ගැන හැදිච්ච කතිකාව විශාල කාර්යභාරයක් කළා. ඒ කතිකාව නොතිබ්බා නම් සමහර විට ඔය ඩොලර් අර්බුදයක් එක්ක ආව අර්බුදය එක්ක නිකම් කැරලි කෝලහාළ විදියේ එකක් එන්න තිබුණා. කොල්ලකෑම්. ජීවත් වෙන්න අමාරුයි කොහේ හරි පැන්නා, කැඩුවා. එහෙම විසඳෙන්න අවශ්‍ය වුනේ නැහැ මොකද focus එකක් කාලයක් තිස්සේ හැදිච්ච කතිකාවෙන් ලැබිලා තිබුණා.

තුන්වෙනි සාධකය තමයි දැන් ගෝඨාභය ටිකක් වෙන කෙනෙක් විදියටනේ ආවේ. 2019 ආවේ ඒ තියෙන රාජපක්ෂවරු සහ ඒ දේශපාලනයෙන් එළියේ technocrat කෙනෙක්, හරියට වැඩ කරන මිනිහෙක් විදිහට අමුතු ප්‍රතිරූපයක් හදාගෙන. හැබැයි ඒ වෙද්දි තවත් දෙයක් සිද්ධ වෙලා තිබුණා, නමුත් 2022 වෙනකොට ගෝඨා අසමත් (fail) කියන අදහස සම්පූර්ණයෙන් සමාජ ගත වෙලා තිබුණා. මේ තමයි ප්‍රධාන තුන්වෙනි සාධකය. ගෝඨාගේ අසමත්කම එයාම ඔප්පු කරමින් හිටියා කාලයක් තිස්සේ. පරිසර අර්බුද තිබුණා, ගුරු අරගල තිබුණා, විවිධ අරගල තිබුණා. එකින් එක මෙයා අසමත් කියන එක ඔප්පු කරලා තිබ්බා. ඒ නිසා ඒකත් අතිශය වැදගත් සාධකයක්, මොකද ඒ නිසා තමයි මම හිතන්නේ "ගෝඨා ගෝ ගම" වගේ එකක් එන්න පුළුවන්කම තිබ්බේ. ඒ කියන්නේ එයා ගැන තිබ්බ කලකිරීම. ඒ කලකිරීම නිසා පොහොට්ටුව වටා තිබුණ ඔය 69 ලක්ෂය පදාස පිටින් කැඩිලා ගිහිල්ලා ඒ වෙනකොට. ඒ පදාස ලොකු කාර්යභාරයක් කළා මේ අරගලයේ. විශේෂයෙන් පොහොට්ටුවෙන් කැඩිච්ච පදාස. එතකොට ගෝඨා අසමත් කියන එක තමයි තුන්වන සාධකය. නැත්නම් ගෝඨා ගැලවෙන්න තිබුණා. ඒ කියන්නේ රාජපක්ෂ පවුලට ප්‍රහාරයක් ආවාට දෙජම් එක හැදිලා තිබුණාට මිනිහාට ලොකුවට දූෂණය පිළිබඳ ව චෝදනා තියෙනවා කියන එක එච්චර කතා නොතිබුණාට, මිනිහා අසමත් නිසා ලොකු කලකිරීමක් තිබුණා. විශේෂයෙන් ගෝඨාභය බලයට ගෙන්න පත්වෙච්ච පිරිස අතර ලොකු කලකිරීමක් ඇතිවුනා.

හතර වෙනි සාධකය තමයි ගෝල්ෆේස් එක. ගෝල්ෆේස් එක තමයි අරගලයේ සංකේතමය කේන්ද්‍ර ය. ගෝල්ෆේස් එක වටා තමයි ඒ අදාළ පුරෝගාමී කොටස් යම් විදියකට සංවිධානය වුනේ. එතකොට ඔය සාධක හතර එක මොහොතේ එකපිට පතිත වුණා. ඒ හතරම වැඩ කළ නිසා තමයි එවච්චර දැවැන්ත ජනතා නැගිටීමක් විදියට ඒක මතු වුනේ. එතකොට ඒක තේරුම් ගන්න එක වැදගත්. අපි දැන් අරගලය ගැන නැවත කතා කිරීමේ දී අරගලය ඇති වුණ හේතු දැන ගැනීම වැදගත්. ඒ කියන්නේ ඔය සාධක හතරෙන් එකක් මඟ හැරුණා නම් ඔය පන්නේ අරගලයක් පැන නගින්නේ නැහැ කියන එකයි මගේ අදහස. එතකොට අපි දන්නවා අරගලය අප්‍රේල් 09 දා පටන් ගත්තා. එක්තරා විදියට peak එකක් විදියට ආවා ජූලි 09. මාස හතරකට ආසන්න කාලයක වුණ සිද්ධි ටික අපි දන්නවා.

මගේ දෙවෙනි තේමාව තමයි අරගලය මොකක් ද කියන එක තේරුම් ගැනීම. මොකක් ද ඒකේ ලක්ෂණ ? මේක ලොකු ජනතා නැගිටීමක්. මේක වටා එක් වුණා විවිධාකාර අය. විවිධ පන්නයේ අය. විවිධ පාන්තික කොටස්. විවිධ ජාතික කොටස්. සමහරවිට පරස්පර විරෝධී වුවමනාවන් තිබුණ කොටස්. මොකද focus එකට එකඟ වෙන්න පුළුවන් වුණා. ඒක තේමාවක්. එතකොට ඒකේ තියෙන පුළුල් ස්වභාවය නිසා ඒක homogenize, සමජාතික කණ්ඩායමක් නෙමේ විවිධ ජාතියේ කණ්ඩායම්. විවිධ දේවල්වලට ආවා. පරස්පර අදහස් තිබ්බා. හැබැයි කට්ටිය එකඟ වුණා වැඩේ කරන්න. දෙවැන්න තමයි ඒ නිසාම අරගලයට අයිතිකාරයෙකුත් නැහැ. අරගලයට අයිතිය කියන්න පුළුවන් කෙනෙකුත් නැහැ. ඒක ඊට ලොකුයි. ඒකේ විවිධ කොටස් ක්‍රියාත්මක වුණා. ඒක කොයි තරම් ලොකු ද කියන්නේ, ඒ නිසා ඒකට අයිතිකාරයෝ ගොඩක් ඉන්නවා. ඒක එච්චර ලොකු නිසා අයිතිය කියන්න පුළුවන්. ඒක හරියට ලකුණු වෙලා නැහැ නේ. ඒක තමයි දෙවන ලක්ෂණය. තුන්වැන්න තමයි ඒ තරම් විශාල ජනතා නැගිටීමක් ලොකු කාලයක් අදින්න බැහැ, ලොකු ගමනක් යන්න බැහැ. එහෙම අරගලයක තියෙන්නේ සරල තේමාවක්. ඒක ඉටුකර ගන්න තමයි යන්නේ. ඒ වගේ සරල umbrella theme එකකට අර සමස්ත cross section එකට මේ කෙළවරේ ඉදන් අනිත් කෙළවරට සියල්ල එකතු කරගන්න පුළුවන්. එතකොට ඒ පන්නයේ දැවැන්ත ජනතා නැගිටීමක් කියන්නේ මාර දිග ලොකු අරමුණු කරා යන දීර්ඝ කාලීන ක්‍රියාවලියක් වෙන්නේ නැහැ. එක මොහොතක වැඩක්. ඒ මොහොතේ යම් ජයග්‍රහණයක් (achievement) ගත්තාම විසිරිලා යන්න සිද්ධ වෙනවා. ඒ කියන්නේ කැලි කැලි කට්ටිය අයින් වෙනවා. එතකොට අරගලය කියන්නේ ලොකු දීර්ඝ කාලීන ක්‍රියාවලියක් නෙමේ. ඒක මාස 4ක් තිබ්බාට අපි දේශපාලනිකව කිව්වොත් මොහොතක්. සරල අරමුණක් (objective) එක්ක තිබ්බා, ඒක ජයග්‍රහණය කළා. ඒක තමයි ලක්ෂණ. එකේ තියෙන්නේ සරල ඉලක්කයක්. ඒ වටා තමයි අරගලය පැන නැගුනේ. ඒක හැම දෙනාටම පිළිගන්න පුළුවන් දෙයක්. ඊළඟට මේ අරගලවල විශේෂ ලක්ෂණයක් තමයි මේවා ආයෙත් ඒ විදියට නැවත නැවත repeat කරන්න බැහැ. දැන් මේ සාධක ගණනාවක් එක මත එක පතිත වෙලා නේ මේක පත්තු වෙන්නේ. හැබැයි දැන් ඒක අපි හිතුවොත් තව අවුරුද්දකින්, මාස තුනකින් ඒ විදියටම නැවත කරන්න පුළුවන් කියලා ඒක නැවත කරන්න බැහැ. මොකද කොන්දේසි ඒ විදියට වැඩ කරන්නේ නැහැ. දැන් තත්ත්වයන් වෙනස් වෙලා තියෙන්නේ. ඒ කොන්දේසි හතර මම නම් කරපු ඒවා වුණත් ඒ විදියට වැඩ කරන්නේ නැහැ.

එතකොට අරගලය ඉස්සරහට යනවා නම් දැන් අපි තේමාව දැම්මේ පශ්චාත් අරගල කියලා නේ. එකෙන් අදහස් වෙනවා අරගලය ඉවරයි වගේ එකක්. නැතිනම් අපිට කියන්න පුළුවන් පශ්චාත් කතාව අතහැරලා දාලා අරගලයේ එක face එකක් ඉවර වුණා. ඊළඟ face එකක් එනවා. ඒ කියන්නේ continuation එකක් තියෙන්න පුළුවන්, හැබැයි ඒකම නෙමේ. වෙන එකක්. එහෙම නැතිනම් අපිට හඳුන ගන්න පුළුවන් පියවර විදියට. දෙවනි පියවර, තුන්වන පියවරක් ඒ විදියට අපිට හඳුන ගන්න පුළුවන්. තිබුණ අරගලය නැවත ඒ විදියටම වෙන්නේ නැහැ. ඒ කොන්දේසි වෙනස් සහ අපි දන්නවා නේ මේ වගේ අරගල ලෝකයේ සිද්ධ වෙලා තියෙනවා. දැවැන්ත ජනතා නැගිටීම් සිද්ධ වෙලා තියෙනවා. මේ වගේ අරගල අවසන් වෙන්න පුළුවන් ආකාර දෙකක් තියෙනවා. නිකමට හිතුවොත් මේ වුනේ අවසානයක් කියලා. අපිට මේකට continuation කියන්නත් පුළුවන්, ඊළඟ පියවර කියන්න පුළුවන්. ඒක අවසානයක් තමයි. ඒකට ලෝකයේ ගොඩක් උදාහරණත් තියෙනවා, අතීශය සාර්ථක ආශ්වාදනීය අරගල දැවැන්ත ඛේදවාචකයකට මඟ පාදමින් ඉවර වෙන්න පුළුවන්. ඒ කියන්නේ සමාජය තිබ්බටත් වඩා පස්සට ගිහිල්ලා. අනිත් එක තමයි ජයග්‍රහණයකට මඟ පාදමින් ඒක ඉස්සරහට

යන්නත් පුළුවන්. ඒ කියන්නේ ඛේදවාචයකට මග පාදන්නත් පුළුවන් අරගලයක්, නැතිනම් ජයග්‍රහණයකින් කෙළවර වෙන්නත් පුළුවන්. ලෝක පරිමාණයෙන් ඒවාට උදාහරණ තියෙනවා. මගේ අදහස මේ සිද්ධ වුණ අරගලය ඉවරයි. ඒ ජනතා නැගිටීමට අවශ්‍ය කොන්දේසි එකිනෙක මත පතිත වෙලා හැදීච්ච ඒ අරගලයේ ස්වභාවය ඉවරයි. දැන් අපිට යන්න වෙන්නේ, මම හිතන්නේ පශ්චාත් කියන වචනය එච්චර පාවිච්චි නොකර මං කියන්නේ ඊළඟ අදියරට යන්න වෙනවා. මේක ඉවරයක් කරන්න ඕනි. මේක අතරමග නවත්වලා ඛේදවාචයකින් නවත්තලා අපිට ඉන්න බැහැ නේ, මේක ගෙනියන්න ඕනි. ඒ සඳහා අපිට ඊළඟ face එකට මාරු වෙන්න වෙනවා, ඊළඟ face එක හැබැයි යම් සංවිධානාත්මක ස්වරූපයේ face එකක් වෙන්න ඕනි. ඒ අවස්ථාවේ ආව ඒ රැල්ල, ඩොලර් අර්බුදය ඒවා මේවා එක්ක ආව රැල්ල එක්ක යන්න පුළුවන් දුර ගිහිල්ලා ඉවරයි. ඊළඟට අපිට යන්න තියෙනවා ටිකක් දිග ගමනක්. මෙතන සිද්ධ වුනේ ගෝඨා පැන්නුවා, රාජපක්ෂ පවුල වැට්ටුවා, ඊළඟට ඔය කැබිනට් මණ්ඩලයත් අයින් කළා. හැබැයි අපිට තව තියෙනවා දීර්ඝ ගමනක්. ඒ දීර්ඝ ගමනට අපිට අවශ්‍යයි මීට වඩා සංවිධානාත්මක ස්වරූපයක් අරගලයේ දෙවනි face එකට.

දෙවැනියට කියන්න ඕනේ මේ අරගලයේ ලක්ෂණ ගැන. අපේ අරගලයට විතරක් නෙමේ ලෝක අරගලවලටත් පොදුයි. තුන්වැන්න තමයි මේ මොහොත මොකක්ද? සහ මොකක් ද අපිට ඉදිරියට කරන්න පුලුවන් කියන එක ගැනත් කතා කරන එක වැදගත්. මම කිව්වේ විශාල ජනතා නැගිටීම් ඉවර වෙන්න පුළුවන් ආකාර දෙකක් තියෙනවා කියලා. එකක් ඛේදවාචයකට මග පාදමින්, දෙවැන්න තමයි ප්‍රගතිශීලී ජයග්‍රහණයකට මග පාදමින්. දැනට අපි ගත්තොත් ඔය විකල්ප (option) දෙකම ජීවමානයි (live). ඒ කියන්නේ ඛේදවාචකයකට මග පාදන අක්ෂයෙත් දේවල් ක්‍රියාත්මකයි. ඒක ජීවමානයි. ඊළඟට ජයග්‍රහණයට මග පාදන අක්ෂයත්, ඒකත් ජීවමානයි. ඔය දෙකටම විවෘතව option තියෙනවා. ඔය දෙකම මේ මොහොතේ වැඩ කරනවා. ඒ අක්ෂ දෙකම තියෙනවා. දැන් ඛේදවාචක අක්ෂය ගත්තොත් ඒ තමයි අපි දන්න දැන් තියෙන දේශපාලන යථාර්ථය (political reality). රනිල් සහ ඔය රාජපක්ෂ කණ්ඩයම සහ ඔය ප්‍රධාන දේශපාලන ධාරාවේ කොටස්, ඊළඟට දූෂිත ව්‍යාපාරික කල්ලිය, පොලීසිය හා හමුදා යාන්ත්‍රණ සහ අන්තර්ජාතික වුවමනාවන්. ඔය ඔක්කොම එක කුලකයක් විදියට සම්බන්ධ වෙලා ඛේදවාචක direction එකක මේ ගමන ඉස්සරහට යන එක දැන් establish කරන ඒ වැඩේ වෙනවා. අපි දන්නවා නේ මේ මොහොතේ අපේ දේශපාලනය මොකක් ද කියලා. ඒ අක්ෂය දැන් විවෘතයි, ඒක තියෙනවා. ඊළඟට ප්‍රගතිශීලි අක්ෂයකුත් තියෙනවා. hopeless නැහැ. මේ වෙන කොට ජන මතය තියෙනවා ඉතා සුබවාදී තැනක. ඒ මතය, අදහස කාලයක් තිස්සේ ගොඩනැගුණා. ඒ අදහස තමයි ඔය ප්‍රධාන දේශපාලන ධාරා දෙක, අපි ලෙහෙසියට ගමු නිල් පාටයි කොළ පාටයි කියලා. ඔය ධාරා දෙක එකක් කියලා සමාජයේ කාලයක ඉදලා තිබ්බාට ඒක සමාජගත වුණා අරගලය තුල. ඒ කියන්නේ ඇඟට දැනුනා මුන් දෙගොල්ලෝම හොරු, මුන් තමයි මේකට කෙළියේ, අපිට වෙන විකල්පයකට යන්න ඕනි කියන අදහස කාලයක් තිස්සේ තිබ්බා. හැබැයි ඒක අරගලය විසින් සමාජ ගත කළා, ඒක බැස්සුවා. ඒකට අපිට උදාහරණත් තියෙනවා නේ. ගොල්ෆේස් එකේ තිබ්බ ප්‍රධාන සටන් පාඨ ගත්තොත්, එක ප්‍රධාන සටන් පාඨයක් තමයි 74 වසරක සාපය ඉවර කරමු කියලා. එකේ අදහස 74ක් තිස්සේ නිදහසින් පස්සේ මේ නිල් පාට හෝ කොළ පාට තමයි මාරුවෙන් මාරුවට මේක run කළේ, දැන් මේක ඉවර කරන්න ඕනි, දැන් ඇති. ඒකෙන් අදහස් කරනවා මේ දෙගොල්ලොම මේකට සම සමව වග කියන්න ඕනි, මේ දෙගොල්ලෝම නොවන ඔළු මාරු නොකරන එක්තරා ක්‍රම වෙනසක් වගේ පැත්තකට අපිට යන්න අවශ්‍යයි කියන අදහස. ඒක එහෙම නැති වෙලා නැහැ, අරගලයෙන් එක් සමාජගත වුණා. ඒ නිසා තමයි තාම පොහොට්ටුකාරයන්ට හරි යූඑන්පී කාරයන්ට හරි ගමකට යන්න බැරි. තාම එළියට බහින්න බැහැ නේ. ඒ මේ අදහස සමාජගත වීමේ ප්‍රතිඵලයක්. එතකොට ඒ වගේම ගොල්ෆේස් එකේ තව සටන් පාඨ තිබ්බා, හොරු අල්ලමු, කොල්ලකෑ ධනය ආපසු අරගමු කියලා ප්‍රධාන සටන් පාඨ තිබ්බා. ඒ ඔක්කොමෙත් හරය වුනේ මේ කණ්ඩායම් දෙකම දැන් ප්‍රතික්ෂේප කරන තැනකට ආ බව. ඒක තමයි දැන් අපේ ජයග්‍රහණ අක්ෂය. ඛේදවාචක අක්ෂය නෙමෙයි. ජයග්‍රහණ අක්ෂයේ සුබවාදී පැත්තට තියෙන ජනමතය. මහ පරිමාණයෙන් ඒක තාම තියෙනවා. දැන් ලොකු ජනමතයක් හැදිලා තියෙනවා මේක ඉවර කරමු. මේ ක්‍රමය, මේ දූෂිත කල්ලි දෙකේ ගමන ඉවර කරමු කියලා.

දැන් සාමාන්‍යයෙන් political project එකක context එක විතරක් නෙමේ වැදගත්, agent කෙනෙක් ඉන්න ඕනි. අපේ ගොඩක් සාකච්ඡාවල තියෙන එක ප්‍රශ්නයක් අපි නියෝජිතයෙක් ගැන හිතන්නේ නැහැ. අපි නිකම් යෝජනාවක් දානව, අපි හිතමු system change කියලා. system change එකක් ඕනි කියලා අපි කියනවා, හැබැයි අපේ බුද්ධිමතුන්ගේ ප්‍රශ්නය ඒ ගොල්ලෝ නිකම් විසිකරලා දානවා අදහස්. මගේ දේශපාලනය ඇතුලේ ඒක කරන්න theory එක වගේම යාන්ත්‍රණයකුත් ඕනි. ඒක දේශපාලනයේ වැදගත් සාධකයක්. කරන්න යාන්ත්‍රණයක් ඕනි, නියෝජිතයෙකුත් ඕනි. දැන් මේ මොහොතේ තියෙන අපේ සාර්ථකත්වයට මග පාදන්න, ඛේදවාචක අක්ෂය නෙමේ ජයග්‍රාහි අක්ෂය දිහා බැලුවොත් context එකක් අපිට තියෙනවා, ජනමතයත් තියෙනවා. දැන් මේ මොහොතේ තියෙන සුබවාදී එක තමයි ඒකට නියෝජිත කෙනෙක් ඉන්නවා අපිට. ඒක තමයි ජාතික ජනබලවේගය කියලා මම හඳුනා ගන්නේ. ඒ තියෙන පොදු වුවමනාව ඉටු කරන්න. ඒක සරලව අපිට කියන්න පුළුවන් ප්‍රභූ පන්තියක්නේ මේක අල්ලගෙන හිටියේ, ඒ ප්‍රභූ පන්තියෙන් මේක නිර්ප්‍රභූ පන්තියකට මේක මාරු වෙන්න නියමිතයි. ජාතික ජනබලවේගයට මග පැදුනොත් මේ කල්ලි දෙක විසින් ගෙනිච්ච ගමන ඉවර වෙන ලක්ෂණ තියෙනවා. එකක් තමයි දැනට තියෙන අතිශය යටත්වැසි මානසිකත්වය ඉවර වෙන්න පුළුවන් කියන එක. ඒ කියන්නේ යටත් වැසියෙක් වෙනවාට වඩා පුරවැසියෙක් බිහි වෙන ඉඩක් හැදෙනවා. ඡන්දයකට ගිහිල්ලා මොකක් හරි දෙන වරදානයකට ඡන්දය

දෙනවාට වඩා එහා ගමනක් යන පුරවැසියෙක් වෙන ඒ potential එක තියෙනවා.

ඒකට අපිට අරගලයෙන් ලොකු කාර්යභාරයක් කළා. ඒ කියන්නේ අභිමානය ජනතාවට ලබා දුන්නා. අරගලය විසින් මිනිසුන්ට ලබා දුන්නා මිනිසුන්ට විශ්වාසයක් අපිට පුළුවන් කට්ටිය ගෙදර අරින්න කියලා. ඒ විශ්වාසය ලැබුණා. දෙවැනි එක, ලංකාවේ නිදහසින් පස්සේ දූෂණ නැති පාලනයකට ඉඩ හැදෙනවා ඒ option එක ඇතුලේ. ඊළඟට අපිට කරගන්න බැරි වුණ දෙයක් තමයි නිෂ්පාදන ආර්ථිකයකට යන්න බැරිවීම. අපිට තිබුනේ කෘෂි ආර්ථිකයක්, ඊට පස්සේ සේවා ආර්ථිකයකට මාරු වුණා. නිෂ්පාදන ආර්ථිකයක් ගැන සිහිනයක් ලංකාවේ මුලින්ම හැදුවේ මීට අවුරුදු 100ට කළින්. විමලසුරේන්ද්‍ර මුල්කර ගෙන තමයි ඒක හැදුනේ. ඉන්දියාව නේරුලා හදද්දි අනාගතවාදී ඉන්දියාව නිෂ්පාදන ආර්ථිකයක් සහිත ඉන්දියාව imagine කරද්දි විමලසුරේන්ද්‍ර ඒ වැඩේ කළා. හැබැයි විමලසුරේන්ද්‍රගේ project එක අසමත් වුණා. හැබැයි අවුරුදු 100ට පස්සේ නැවත අපිට අවස්ථාවක් එනවා ජාතික ජනබලවේගය හරහා අපිට නිෂ්පාදන ආර්ථිකයකට මාරු වෙන්න. ඊළඟ කාරණය තමයි අපේ සංවර්ධනය කියලා එකක් තිබ්බා, ඒක ඇවිල්ලා සාටෝපකාරී පුද්ගල කේන්ද්‍රීය ණය තව තව ගොඩ ගහන සංවර්ධන මාවතක අපි ගියේ. ඒක පැහැදිලි කරන්න ඕනි නැහැ. ඊට වෙනස් මානුෂික, පරිසර හිතකාමී අනාගතවාදී සංවර්ධන දිශාවකට යන්න පුළුවන්කම ලැබෙනවා.

එතකොට දැනට තියෙන යථාර්ථය තමයි බෙදවාචක අක්ෂයත් ක්‍රියාත්මකයි, ජයග්‍රහණය කරා යන අක්ෂයත් ක්‍රියාත්මකයි. ඒ දෙකම ජීවමානයි. balance එකක් දැන් තියෙන්නේ. මගේ තක්සේරුව ඉදිරි මාස කිහිපය හරිම තීරණාත්මකයි. මේ මොන අක්ෂය ද ජයග්‍රහණය කරන්නේ කියන එක ඒ මත තීරණය වේවි. ගෝඨාටත් වඩා බෙදවාචකයක නේ දැන් අපි ඉන්නේ, ක්‍රමය ගත්තොත් එහෙම. ඒ කියන්නේ සියල්ල උල්ලංඝනය වෙමින් යනවා, ව්‍යවස්ථාවක් අදාළ නැහැ, කිසිම දෙයක් අදාළ නැහැ, කොල්ල කල්ලියේ හොඳම එක. එතකොට මෙතනද අපි නවතින තැන. නැතිනම් අපේ ජයග්‍රාහී මාවතට යන එකද ඉස්සරහට එන්නේ කියන එක තීරණය වෙන්නේ. මේ line දෙක වැඩ කරන විදියත් එක්ක. මේ දෙකටම වෙනස් තුන්වන අක්ෂයක් ගැන කවුරුන් හෝ ඇහුවොත් තුන්වන අක්ෂයක සළකුණක් පෙනෙන්න නැහැ. මට පෙනෙන්නේ අක්ෂ දෙකක් විතරයි. එකක් බෙදවාචකයට යන එක නැතිනම් දැනට තියෙන context එක සහ agent ඉන්න ඔය line එක.




**නීතිය හා සමාජ භාරය**
**අංක 03, කින්සි ටෙරස්,**
**කොළඹ 08,**
**ශ්‍රී ලංකාව**
**දුරකතන :+ 94 (0) 112684845**
**ෆැක්ස් :+ 94 (0) 112686843**
**admin@lstlanka.org**
**www.lstlanka.org**